දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

දේවිසා 3.1 - තුලනාත්මක දේශපාලනය
PSG 3.1 - Comparative Politics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. "තුලනාත්මක දේශපාලනය" නිර්වචනය කොට එය විෂයක් ලෙස සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

02. තුලනාත්මක දේශපාලන විද්‍යා විෂයේ සංවර්ධනයට ග්‍රීක යුගයේ දේශපාලන චින්තකයින්ගේ දායකත්වය අගයන්න.
(ලකුණු 20 යි)

03. තුලනාත්මක දේශපාලන විද්‍යාව අධ්‍යයනයේ සාම්ප්‍රදායික ප්‍රවේශයෙහි (Traditionla Approach) පැවැති දුර්වලතා සහ අඩු පාඩු ඔබ හඳුනාගන්නේ කෙසේ ද?
(ලකුණු 20 යි)

04. තුලනාත්මක දේශපාලන විද්‍යාවේ නූතන සංවර්ධනයට චර්යාවාදී ප්‍රවේශය (Behavioral Approach) මගින් ලබාදුන් දායකත්වය විභාග කරන්න.
(ලකුණු 20 යි)

05. ප්‍රජාතන්ත්‍රවාදය (Democracy) නිර්වචනය කොට, එහි මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය (Constitutionalism) නිර්වචනය කොට යහපත් ආණ්ඩුකරණයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ මොනවා ද?
(ලකුණු 20 යි)

07. "පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ මෙන්ම ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ද යහපත් අයහපත් ලක්ෂණ පවතී." සාකච්ඡා කරන්න.
(ලකුණු 20 යි)

08. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමයේ යහපැවැත්ම හා ස්ථාවරත්වය සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයේ භාවිතාව මගින් කර ඇති බලපෑම ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?
(ලකුණු 20 යි)

09. දේශපාලන සමාජානුයෝජනය (Political Socialization) යනු කුමක්දැයි පැහැදිලි කොට, එහි ප්‍රධාන කාරකයන් පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

10. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම **දෙකක්** (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. දේශපාලන සංවර්ධනය (Political Development)

II. දේශපාලන සංස්කෘතිය (Political Culture)

III. දේශපාලන සහභාගිත්වය (Political Participation)

IV. දේශපාලන ක්‍රම න්‍යාය (Political System Theory)